# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,602 — 1965 දෙසැම්බර් 31 වැනි සිකුරාදා — 1965.12.31

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1961 වර්‍ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

#### 12 (1) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය

අධ්‍යාපන අධ්‍යක්‍ෂ නැන්පත් අර්නස්ට් හර්බට් ද අල්විස් වන මම, 1961 වර්‍ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වෙනි වගන්තිය යටතේ පැනවුණු, 1962 වර්‍ෂයේ මාර්තු මාසයේ 28 වෙනි දින අංක 12,998 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද, නුගේගොඩ, කො/ශාන්ත ජෝසප් බාලිකා ඉංග්‍රීසි පාසලේ සියලුම දේපල, රජය වෙනුවෙන් භාරගැනීමට, දකුණු කොළඹ, දිස්ත්‍රික් පාඨශාලා පරීක්‍ෂක නැන්පත් පතිරාජ මුදියන්සෙලාගේ මුදලිහාමි මුරුතැන්ගෙ මහතාට මෙයින් බලය පවරමි.

2. එකී පතිරාජ මුදියන්සෙලාගේ මුදලිහාමි මුරුතැන්ගෙ මහතා රජය වෙනුවෙන් පූර්වෝක්ත දේපල භාර ගැනීම වැළැක්වීමට හෝ බාධා කිරීමට හෝ විරෝධය දැක්වීමට උත්සාහ කරන සෑම පුද්ගලයෙක්ම ඉහත කී පනත යටතේ වරදකරුවකු වෙනුවා පමණක් නොව, එකී පනතේ 27 වෙනි වගන්තිය යටතේ දඬුවමට භාජන කරනු ලැබිය හැකි ද වේ.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්‍ෂ.

1965 දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

12-1693/1

---

### 1961 වර්‍ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

#### 12 (2) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය

දකුණු කොළඹ, දිස්ත්‍රික් පාඨශාලා පරීක්‍ෂක නැන්පත් පතිරාජ මුදියන්සෙලාගේ මුදලිහාමි මුරුතැන්ගෙ වන මම, 1962 වර්‍ෂයේ මාර්තු මාසයේ 28 වෙනි දින අංක 12,998 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ, 1961 වර්‍ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වෙනි වගන්තිය යටතේ පැනවුණු පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද, නුගේගොඩ, කො/ශාන්ත ජෝසප් බාලිකා ඉංග්‍රීසි පාසලට අයත් දේපල, 1966 වර්‍ෂයේ ජනවාරි මාසයේ 7 වෙනි සිකුරාදා පෙරවරු 10 ට එකී කො/ශාන්ත ජෝසප් බාලිකා ඉංග්‍රීසි පාසලේ දී රජය සඳහා ද, වෙනුවෙන් ද භාර ගැනීමට අදහස් කරන බව, එම දේපල ගැන අයිතිවාසිකම් ඇති සියලු දෙනා වෙතම මෙයින් දැනුම් දෙමි.

2. එම දේපලට අයිතිවාසිකමක් ඇති සියලු දෙනාම නැතහොත් ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින් මෙහි (1) ඡේදයෙහි සඳහන් වූ දිනයෙහි නියමිත වේලාවට එකී ස්ථානය වෙත පැමිණ එම දේපල රජය සඳහා ද, වෙනුවෙන් ද භාර ගැනීමට මට ඉඩ දෙන ලෙසත්, සහාය වන ලෙසත් මෙයින් නියෝග කරමි.

පී. එම්. එම්. මුරුතැන්ගෙ,
පාඨශාලා පරීක්‍ෂක.

1965 දෙසැම්බර් මාසයේ 28 වැනි දින,
කොළඹ 7, අධ්‍යාපන කාර්‍යාලයේ දීය.

12-1693/2

---


ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි

1853——ආර් 11293—6,875 (65/12)